**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - 2015**

**------------------------------------------------**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 49 දරන පනතින් සංශෝධිත 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**-------------------------------------**

**2.2.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර) අනුකූල වීම**

**----------------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය - ප්‍රමිතියේ නියම කර ඇති ආකෘතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ -**

(i) රු.231,076,039 ක් පිරිවැය වූ හා ධාරණ අගය රු. 23 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් විෂයයන් 3,161 ක් ප්‍රමිතියේ 51 වගන්තිය ප්‍රකාරව ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කිරීමෙන් තොරව හා වෙනස්කම් ගිණුම්ගත කිරීමෙන් තොරව මණ්ඩලය විසින් භාවිතා කර තිබුණි.

(ii) මණ්ඩලය විසින් එකතුව රු.5,298,074,392 ක් වූ පිරියත හා යන්ත්‍රෝපකරණ, අභ්‍යන්තර මාර්ග, ඇවිදින මාර්ග, ජීප් රථ මං තීරු, බෝක්කු, මායිම් බිත්ති, වැටවල්, ගේට්ටු, ගොඩනැගිලි පිවිසුම්, වැසි ජල කාණු, සැපයුම් මාර්ග, ජාල මාර්ග මැන්හෝල් සහ වාරිමාර්ග ඇළ ආදිය දේපල, පිරියත හා උපකරණ යටතේ ව්‍යුහයන් ලෙස වර්ගීකරණය කර තිබූ අතර, ඉහත ස්ථාවර වත්කම්වල ස්වභාවය, සුන්බුන් වටිනාකම හා ජීව කාලය සහ පරිභෝජනය පිළිබඳ අපේක්ෂිත රටාව හා වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එකිනෙකට වෙනස් වුවද, සියලු වත්කම් වර්ෂයකට සියයට 5 ක අනුපාතයට ක්ෂය කරනු ලැබේ.

**(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 19 - සේවක ප්‍රතිලාභ -** අනාගත විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් පියවීම සඳහා වෙනම සැලැස්මක් මණ්ඩලය විසින් ස්ථාපිත කර නොතිබුණු අතර ජංගම වත්කම් යටතේ වූ භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම්වල (REPOS) ආයෝජන විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් පියවීම සඳහා යොදාගෙන තිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩමක් අත්පත් කරගැනීම සඳහා වැය කරන ලද රු.17,500,000 ක තැන්පතුවක් වෙනත් ණයගැතියන් යටතේ සාවද්‍යව දක්වා තිබුණි. තවද ඒ සඳහා රු.1,144,860 ක මුදලක් හානිකරණය ලෙස ප්‍රතිපාදනය කර තිබූ බැවින් හානිකරණය සඳහා ප්‍රතිපාදනය සමාන මුදලකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු.363,320 ක තථ්‍ය ලැබිය යුතු ශේෂය දක්වනු වෙනුවට 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති පිළිබඳ ප්‍රාරම්භක වියදම් සඳහා රු.15,142,236 ක ශේෂයක් අත්තිකාරම් යටතේ ඇතුළත් කර තිබුණි.

(ඈ) ආයෝජන මණ්ඩල වෙබ් අඩවිය පවත්වා ගැනීමේ සේවාව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පුද්ගලික සමාගමකින් මණ්ඩලය වෙත ලැබී තිබූ අතර 2015 සැප්තැම්බර් මාසය දක්වා රු.2,548,470 ක් වූ ගෙවීම් සිදු කර තිබුණි. කෙසේවුවද 2015 ඔක්තෝබර් සිට දෙසැම්බර් මාසය දක්වා ගෙවිය යුතු රු.849,490 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) රු.3,829,237 ක් වූ භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම සමාලෝචිත වර්ෂය සඳහා ආදායම ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඉ) ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.3,771,572 ක ඉඩම් වාරිකය ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) වෙනත් ලැබිය යුතු මුදල් යටතේ දක්වා තිබූ රු.507,650 ක මුදල් ඌනතාවයක් මූල්‍ය ප්‍රකාශන සටහන්වල අසම්භාව්‍ය බැරකමක් ලෙස හෙළිදරව් කර තිබුණි.

**2.2.3 නොසැසඳූ ශේෂ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව, 2015 ජනවාරි 01 දිනට සමුච්චිත ගොඩනැගිලි ක්ෂය ශේෂය රු.524,774,042 ක් විය. කෙසේ වුවද එය පෙර වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල රු.523,933,258 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් රු.840,784 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 11 සහ 12 යටතේ දැක්වෙන ගොඩනැගිලි ක්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන ගොඩනැගිලි ක්ෂය අතර රු.840,783 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල හා අදාළ උපලේඛන අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල | උපලේඛන අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බිම් කුලිය | 678,123,208 | 677,151,203 | 972,005 |
| ඉඩ නොදෙන ලද එකතු කළ අගය මත යෙදවුම් බදු | 83,255,799 | 83,386,146 | (130,347) |
| ජාතිය ගොඩනැගීමේ බදු | 37,562,332 | 37,875,667 | (313,335) |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ව්‍යාපාරයන්ගෙන් ලැබිය යුතු මුදල්**

(i) විගණනයට ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල රු.473,824,469 ක් වූ අතර ඉන් රු.240,421,739 ක මුදලක් වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කාර්යාල කුලී රු.29,294,592 ක් වූ අතර ඉන් රු.19,908,958 ක් හෙවත් සියයට 68 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(iii) රු.12,955,757 ක් වූ සමස්ත ප්‍රථමයෙන් ගෙවිය යුතු ආපසු නොගෙවන වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟ හිට පැවති බව නිරීක්ෂණය විය.

(iv) රු.290,480,584 ක් වූ හානිකරණය සඳහා මුළු ප්‍රතිපාදනයෙන් රු.246,272,344 ක් හෙවත් සියයට 88 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද, වසා දමන ලද හා මෙහෙයුම් අත්හිටුවන ලද ව්‍යාපෘතිවලින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය. තවද, මෙම ප්‍රතිපාදනය පසුගිය වර්ෂ 6 තුළ සියයට 39 සිට සියයට 61 දක්වා සීඝ්‍රයෙන් වැඩි වී තිබුණි.

(v) 2015 දෙසැම්බර් 31 දිනට රු.207,626,104 ක් වූ ලැබිය යුතු මුළු වාර්ෂික ගාස්තු වලින් සියයට 87 ක් වූ වාර්ෂික ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.181,711,695 ක හානිකරණ ප්‍රතිපාදනයක් කර තිබුණි.

ඉහත නිරීක්ෂණයන්ට අනුව, මණ්ඩලය විසින් හිඟ ශේෂ සඳහා ගෙන තිබුණු අයකර ගැනීම් ක්‍රියාමාර්ග ඉතා දුර්වල මට්ටමක වූ බව අනාවරණය විය.

**(ආ) වෙනත් ණයගැතියන්**

(i) වතුපිටිවල නිවාස ඒකක වෙන්දේසිකරු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.1,604,200 ක මුදලක් වර්ෂ 6 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමක් ඇති බවට තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් නොතිබුණු අතර මෙම හිඟ මුදල අයකර ගැනීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ii) වෙනත් ණයගැතියන් යටතේ දැක්වෙන රු.509,740 ක මුදල් හා තොග ඌනතාවයක් වර්ෂ 12 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි.

(iii) 2015 දෙසැම්බර් 31 දිනට රු.166,989,315 ක් වූ වෙනත් මුළු ණයගැතියන්ගෙන් රු.55,180,104 ක් හෙවත් සියයට 33 ක් රජයේ ආයතනවලින් හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය වූ අතර ගිණුම්වල වර්ෂ 2 කට වැඩි කාලයක් සඳහා හිඟ හිට පැවති රු.37,380,104 ක එම හිඟ ශේෂ අයකර ගැනීම වෙනුවට සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල බොල් හා අඩමාන ණය සඳහා සියයට 100 ක ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.

**(ඇ) අයකරගත නොහැකි සේවක ණය**

2015 දෙසැම්බර් 31 දිනට රු.4,295,126 ක් වූ අයකර ගත නොහැකි මුළු සේවක ණය ශේෂයෙන් රු.606,316 ක මුදලක් අයකරගත නොහැකි ලෙස වර්ෂ 5 කට වැඩි කාලයක් පැවති අතර, හිඟ ශේෂ අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කාර්යයන් දුර්වල මට්ටමක බව එයින් දැක්වුණි.

**(ඈ) ගෙවිය යුතු ශේෂ**

(i) විවිධ ණයහිමියන් පිළිබඳ කාල විශ්ලේෂණය අනුව එකතුව රු.3,425,877 ක මුදලක් වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි.

(ii) එකතුව රු.20,728,678 ක් වූ රඳවාගැනීම් මුදල් වලින් කොන්ත්‍රාත් 37 කට අදාළ රු.9,043,394 ක් හෙවත් සියයට 44 ක් වර්ෂ 3 කට වැඩිකාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය විසර්ජනයන්ගෙන් පසුව ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලින් ලැබිය යුතු රු.215,956,513 ක් අත්හැර දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. |
| (ඇ) | 1999 පෙබරවාරි 26 දිනැති අංක 02/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිලධාරීන් විසින් ඔවුන්ගේ ජංගම දුරකථන මිලදී ගැනීම සඳහා වැයකරන ලද රු.206,891 ක මුදල ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව නිලධාරීන් 6 දෙනෙකු සහ මණ්ඩලයේ එක් උපදේශකවරයෙකු සඳහා ප්‍රතිපූර්ණය කර තිබුණි. |

## 2.5 බලය නොලත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් එහි සේවකයන්ට ප්‍රතිලාභ සඳහා ගෙවීම් සිදුකළ හැකි වන්නේ ඔවුන්ගේ පාලක මණ්ඩලවල අනුමැතිය සහිතව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරය විසින් එම ප්‍රතිලාභ විශේෂයෙන් අනුමත කිරීමෙනි. කෙසේ වුවද 1991 වර්ෂයේදී එවකට ප්‍රතිපත්ති සැලසුම් හා පරිපාලන අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද අනුමැතියක් මත සමාලෝචිත වර්ෂය සඳහා රු.3,509,042 ක මුදලක් වෘත්තීය දීමනා ලෙස මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි, සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය සඳහා රු.2,500 සිට රු.7,500 දක්වා හා රු.1,250 සිට රු.3,750 දක්වා වෘත්තීය දීමනා වැඩි කිරීම සඳහා යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 නොවැම්බර් 24 දින පවත්වන ලද අංක 331 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කර තිබුණි. 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ අවශ්‍ය පරිදි මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශයද ලබාගෙන නොතිබුණි.

(ඇ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව, මණ්ඩලයේ සේවකයන් පැමිණීමේ දිරි දීමනා හා ලබා නොගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් දීමනා යන දෙකම ලබා ගෙන තිබුණි. සේවකයන්ගේ පැමිණීම මත පදනම් වූ වර්තමාන දිරිදීමනා යෝජනා ක්‍රමය වෙනුවට විධිමත් දිරි දීමනා යෝජනා ක්‍රමයක් පිළියෙල කිරීම සඳහා 2012 නොවැම්බර් 14 දින පවත්වන ලද පොදු ව්‍යාපාර කමිටුව විසින් ලබාදුන් නියෝගය ප්‍රකාරව, 2013 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පැමිණීමේ දිරිදීමනා යෝජනා ක්‍රමය වෙනුවට ප්‍රධාන කාර්යසාධන ගෙවීම් යෝජනා ක්‍රමයක් (Key Performance Payment

Scheme) ආදේශ කරන ලදී. මණ්ඩලය විසින් 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2015 වර්ෂය සඳහා රු.351,414,308 ක මුදලක් ප්‍රධාන කාර්යසාධන ගෙවීම් දීමනාව (KPP) ලෙස ගෙවා තිබුණි.

(ඈ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබාගැනීමෙන් තොරව නිලධාරියෙකුට ඔහුගේ වර්තමාන තනතුරේ රාජකාරීන්ට අමතරව දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස අතිරේක වැඩ සිදුකිරීම වෙනුවෙන් 2012 ජුනි 01 දින සිට 2015 ජුනි 30 දක්වා මසකට රු.10,000 බැගින් විශේෂ දීමනාවක් ලෙස රු.380,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඉ) 2015 මාර්තු මාසයේදී සභාපති ඇතුළත් සේවකයන් 17 දෙනෙකුට අතිරේක දිරිදීමනාවක් ලෙස රු.472,123 ක මුදලක් සභාපතිවරයාගේ අනුමැතිය පදනම් කරගෙන ගෙවා තිබූ අතර ඉන් රු.55,544 ක මුදලක් සභාපති සහ තවත් එක් නිලධාරියෙකු විසින් ආපසු ගෙවා තිබුණි. කෙසේ වුවද රු.416,579 ක ඉතිරි මුදල 2016 අප්‍රේල් 30 දක්වා ආපසු ගෙවීමෙන් තොරව පැවතුණි.

(ඊ) මණ්ඩලයේ මානව සම්පත් ප්‍රතිපත්ති සංග්‍රහයේ ඇතුළත් ණය යෝජනා ක්‍රමය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව 2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ. 2014 වර්ෂයේදී මානව සම්පත් ප්‍රතිපත්ති සංග්‍රහය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මණ්ඩලය විසින් ඉල්ලා සිටියද මෙතෙක් එම අනුමැතිය ලැබී නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සේවක ණය ශේෂයන් හා ඒ සඳහා පොලී අනුපාතිකයන් පහත පරිදි වේ.

| ණය වර්ගය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | පොලී අනුපාතය |
|---|---|---|
| | රු. | % |
| වෛද්‍ය ණය | 77,051 | නැත |
| තෑගි වවුචර් | 75,312 | |
| උත්සව අත්තිකාරම් | 2,730,500 | |
| විශේෂ අත්තිකාරම් | 5,168,225 | 4.2 |
| මාස 5 ක ණය | 83,192,690 | |
| අතිරේක මාස 5 ක ණය | 62,198,527 | |
| මාස 1 ක ණය | 3,060,780 | |
| පාපැදි ණය | 553,382 | |
| මෝටර් වාහන ණය | 489,257,702 | |
| එකතුව | 646,314,169 | |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.407,166,738 ක බදු පූර්ව ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ අතිරික්තය රු.432,571,478 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.25,404,740 ක පිරිහීමක් දැක්වුණි. රු.124,831,789 කින් මුළු වියදම වැඩිවීම හා පෙර වර්ෂයේ රු.113,394,809 කින් ආදායම වැඩිවීමට ප්‍රතිරූපීව රු.16,476,869 කින් මූල්‍ය ආදායම අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**-----------------------------------**

සමාලෝචිත වර්ෂය තුළ උසාවි නඩු හා ජාත්‍යන්තර බේරුම් කිරීම් සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ නෛතික හා වෘත්තීය ගාස්තු සියයට 132 කින් වැඩි වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**4.1 කාර්යසාධනය**

**---------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. එබැවින් මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීමේ ඵලදායී කාරකයක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

**ආයෝජන ප්‍රවර්ධනය**

**-----------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන ප්‍රවර්ධන වියදම් සඳහා අයවැයගත වෙන්කිරීම රු.50,000,000 ක් විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු.34,599,084 ක් හෙවත් සියයට 69 ක් පමණක් වැය කර තිබූ අතර එය පෙර වර්ෂය සඳහා රු.67,470,738 ක් විය.

(ii) 2015 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව, 2015 වර්ෂය තුළදී එජඩො මිලියන 2085 සිට එජඩො මිලියන 2785 දක්වා ආයෝජන ඉලක්කයක් සහිතව අධීක්ෂණ විදේශ ගමන් 25 ක් සිදු කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබුණි. ඉන් විදේශ ගමන් 9 ක් පමණක් සංවිධානය කර තිබූ අතර, 2015 වර්ෂයේ ඉතිරි විදේශ ගමන් 16 සංවිධානය කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. එබැවින් එජඩො මිලියන 1095 සිට එජඩො මිලියන 1490 දක්වා හෙවත් සියයට 53 සිට 54 දක්වා ආයෝජන ඉලක්කය ඉටුකර ගෙන නොතිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුළු විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කරගැනීම සියයට 40 කින් පහත වැටීම කෙරෙහි මෙය අයහපත් ලෙස බලපා තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

ඒ අනුව, මණ්ඩලයේ ප්‍රධාන අරමුණු වන ආයෝජන ප්‍රවර්ධනය සහ විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කරගැනීම කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කරගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

**ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතිවල ප්‍රගතිය**

**----------------------------------------------**

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 5 සඳහා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √ * | අත්සන් කරන ලද ගිවිසුම් සංඛ්‍යාව √ * | සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √ * | අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √ ** | වසා දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √ ** | අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව √ ** |
|---|---|---|---|---|---|---|
| 2015 | 220 | 152 | 82 | 20 | 78 | 13 |
| 2014 | 187 | 153 | 92 | 54 | 67 | 4 |
| 2013 | 176 | 145 | 93 | 120 | 38 | 7 |
| 2012 | 238 | 163 | 98 | 79 | 26 | 9 |
| 2011 | 160 | 165 | 99 | 47 | 7 | 4 |
| 2010 | 364 | 270 | 144 | 124 | 28 | 10 |
| එකතුව | **1345** | **1048** | **608** | **444** | **244** | **47** |

√ * පවත්නා ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම ඇතුළත්ව
√ ** ව්‍යාපෘති පිළිබඳ වර්තමාන තත්ත්වය අනුව (ව්‍යාප්ත කිරීම හැර)

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මෙම ව්‍යාපෘති සඳහා ඉලක්ක, ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.
- ක්‍රියාත්මක නොකර හා ආයෝජන උපලබ්ධි වීමෙන් තොරව දිගු කාලයක් පැවතුණු ව්‍යාපෘති වසා දැමීමට මණ්ඩලය විසින් කටයුතු කර තිබීම හේතුවෙන් වසා දැමුණු ව්‍යාපෘති සංඛ්‍යාව 2012 වර්ෂයේ සිට 2015 දක්වා කාලපරිච්ඡේදය තුළ සියයට 200 කින් ක්‍රමයෙන් වැඩිවී තිබුණි.
- ආයෝජන මණ්ඩල ව්‍යාපාරයක් ලෙස පවත්වා ගැනීම සඳහා ආයෝජන මණ්ඩල අවශ්‍යතාවයන්ට ව්‍යාපෘති විසින් අනුකූල නොවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව සියයට 225 කින් වැඩි වී තිබුණි.

**ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන**

2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන පහත දැක්වේ.

| අංශය | 2015 | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|---|
| ---------- | --------- | -------- | --------- | -------- | --------- | --------- |
| | එජඩො මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන | එජඩො මිලියන |
| නිෂ්පාදන | 256.99 | 333.90 | 359.76 | 307.65 | 322.42 | 159.65 |
| කෘෂිකාර්මික | 3.87 | 5.72 | 8.47 | 7.17 | 17.97 | 6.45 |
| සේවා | 255.38 | 506.34 | 236.34 | 426.74 | 269.14 | 29.48 |
| යටිතල | 453.45 | 682.45 | 786.83 | 596.60 | 456.53 | 320.72 |
| ආයෝජන මණ්ඩලයේ නොවන ව්‍යාපෘති | - | 87.85 | - | - | - | - |
| | ---------- | ---------- | ---------- | ---------- | --------- | --------- |
| | **969.69** | **1,616.26** | **1,391.40** | **1,338.16** | **1,066.06** | **516.30** |
| | ====== | ====== | ====== | ====== | ====== | ====== |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- මණ්ඩලයේ සංයුක්ත සැලැස්ම අනුව, 2015 වර්ෂය සඳහා ඉලක්කගත විදේශීය සෘජු ආයෝජන එජඩො මිලියන 3,500 ක් විය. කෙසේ වුවද එජඩො මිලියන 970 ක් එනම් ඉලක්කයෙන් සියයට 28 ක් පමණක් ඉටුකර ගැනීමට මණ්ඩලයට හැකි වී තිබුණි.

- මණ්ඩලය විසින් පවත්වන ලද ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රමාණවත් නොවීම හා රජය විසින් ආයෝජකයින්ට දෙන ලද බදු සහන අඩුකිරීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආකර්ෂණය කරගත් මුළු විදේශීය සෘජු ආයෝජන සියයට 40 කින් අඩු වී තිබුණි.

## 4.2 කළමනාකරණ දූර්වලතා

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ වෙබ් අඩවිය පවත්වා ගැනීමේ කොන්ත්‍රාත්තුවක් පුද්ගලික සමාගමකට මණ්ඩලය විසින් ප්‍රදානය කර තිබූ අතර, එම කොන්ත්‍රාත්තුව 2015 සැප්තැම්බර් 30 දින ඉකුත් වී තිබුණි. කෙසේ වුවද, සේවා ගිවිසුම දීර්ඝ කිරීමෙන් තොරව, සමාගම විසින් මණ්ඩලය සමඟ 2016 මාර්තු 31 දක්වා කටයුතු සිදු කරමින් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා සඳහා විදේශ ගමන් වියදම් රු.612,326 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේ වුවද, මෙම වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට 2016 මාර්තු අවසානය වන විටත් මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඇ) සමාගමකට පවරා දෙන ලද බදු දේපොළ පිළිබඳ හිමිකම් හා අයිතීන් සහ එහි ගොඩනැගිලි හා එම පවරන ලද දේපොළවල ස්ථිරව සවිකරන ලද සියලු පිරියත, යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් ත්‍රිපාර්ශවීය ගිවිසුම් අත්සන් කිරීම මඟින් කිසියම් බැංකුවක හා/ හෝ ණය ලබාදෙන

ආයතනයක උකස් කිරීම සඳහා මණ්ඩලය විසින් ආයෝජන සමාගම්වලට අවසරය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත තොරතුරු ඇතුළත්ව උකස් කරන ලද ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව විධිමත් ලේඛනයක් මණ්ඩලයේ නීති දෙපාර්තමේන්තුව විසින් පවත්වා නොතිබුණි.

* උකස් කරන ලද දිනය
* ගිවිසුම් අංකය
* බැංකුව හා/ හෝ ණය ලබාදෙන ආයතනයේ නම
* උකස් කිරීම් කාලපරිච්ඡේදය

(ii) දේපොළ මත බදු දේපොළ හිමිකම් උකස් කිරීම මඟින් ලබාගත හැකි වටිනාකම පිළිබඳ ප්‍රධාන ගිවිසුමේ හෝ ත්‍රිපාර්ශවීය ගිවිසුමේ කිසිදු සීමා කිරීමක් හෝ සීමාවන් ඇතුළත් කර නොතිබුණි. එබැවින් මූල්‍ය ආයතනවලින් ලබාගත් ණය පැහැර හැරීම හේතුවෙන් බොහෝ සමාගම් ඇවර කිරීම් මඟින් අවසන් වී තිබුණි.

(iii) උකස් කරන ලද දේපොළ වලට අදාළව නිරවුල් නොවූ ගැටලු හේතුවෙන් ඉඩම් වටිනාකම අහිමි වීම්, නිෂ්කාර්ය වූ ඉඩම්වල ආවස්ථික පිරිවැය සහ මණ්ඩලයට ලැබිය යුතු මුදල් ආදිය පිළිබඳ පාඩු ඇරීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

(ඇ) 2000 දෙසැම්බර් 29 දිනට පවතින විදුලි ගාස්තු රේටය ඉදිරියේදී වාර්ෂිකව සියයට 6.9 කට වඩා වැඩිවුවහොත් එකී විදුලි ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමට හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි රබර් නිෂ්පාදන සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව, වැඩි වූ විදුලි ගාස්තු සඳහා රු.1,266,213,466 ක හානිකරණය ගෙවීමේ ප්‍රමාදය මත පොලී හා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC) ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණය විසින් දෙන ලද අවසාන තීරණය ප්‍රකාරව සමාගම විසින් දරන ලද බේරුම්කරණ පිරිවැය සමාගම විසින් ඉල්ලුම් කර තිබුණි. වාණිජ මහාධිකරණයේදී ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය විසින් ලබා දී තිබූ තීන්දුවට එරෙහිව මණ්ඩලය විසින් අභියාචනයක් ඉදිරිපත් කර තිබුණු අතර ආයෝජන මණ්ඩලයට වාසිවන අයුරින් තීන්දුවක් ලබා දී තිබුණි. මණ්ඩලයට වාසිවන අයුරින් ලබා දී තිබූ තීන්දුවට එරෙහිව සමාගම විසින් අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි.

කෙසේ වුවද, පහත සඳහන් කරුණු විසඳා ගැනීමේ අරමුණින් පාර්ශවයන් දෙකම 2015 ජූලි 28 දින නිරවුල් කිරීමේ ගිවිසුමකට එළඹ තිබුණි.

(i) 2014 ජූලි 31 දිනට රු.1,266,213,466 ක් වූ විදුලි ගාස්තු හානිකරණය ඉල්ලුම් නොකිරීමට සමාගම එකඟ වී තිබුණි.

(ii) 2015 මූල්‍ය ප්‍රකාශනවලින් බදු ඉඩම සඳහා රු.213,319,273 ක් වූ ජල ගාස්තු හා වාර්ෂික බිම් කුලී ලියාහැරීමට මණ්ඩලය විසින් එකඟ වී තිබුණි.

(iii) මණ්ඩලය විසින් අඩුකර ඉදිරිපත් කරන ලද අක්කර 357 රූඩ් 2 ක් හා පර්චස් 30.64 ක් වූ ප්‍රමාණයකින් යුතු ඉඩම් ප්‍රමාණය භාරගැනීමට සමාගම එකඟ වී තිබුණි.

(iv) මෙම ගිවිසුමේ දිනයේ සිට බලපැවැත්වෙන වර්ෂ 10 කාලයක් පුරා දැනට ජල පිරිවැය රු.75/ m3 ක් වූ ජල පිරිසිදු කිරීම් පිරියත හා බෙදාහැරීම් තථ්‍ය පිරිවැය, සමාගම විසින් ගෙවිය යුතුය.

මණ්ඩලයේ උපදේශකවරයාට (නීති) අනුව, මෙම කරුණට අදාළ සියලු නඩු දෙපාර්ශවයම විසින් 2016 මාර්තු 28 දින ඉල්ලා අස්කරගන්නා ලදී.

(ඉ) ආයෝජන මණ්ඩලය විසින් පර්ත් වතුයාය මිලදී ගෙන තිබුණු අතර වතුයායෙන් කොටසක් වර්ෂ 5 ක කාලයක් සඳහා කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට (SLSPC) භාර දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් (SLSPC) අදාළ මූල්‍ය ප්‍රකාශන 2006 වර්ෂයේ සිට ආයෝජන මණ්ඩලය වෙත ලැබී නොතිබුණි.

(ii) 2005 වර්ෂයේදී ප්‍රේෂණය කරන ලද රු.මිලියන 10 හැරුණු විට, එකඟ වූ පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් එහි ලාභය ක්‍රමානුකූලව ආයෝජන මණ්ඩලයට ප්‍රේෂණය කර නොතිබුණි. 2006 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පර්ත් වතුයායට අදාළව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 16.47 ක් විය. කෙසේ වුවද ආයෝජන මණ්ඩලය විසින් 2015 දෙසැම්බර් 31 දක්වාත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු නිවැරදි මුදල නිරවුල්ව හඳුනාගෙන වාර්තා කර නොතිබුණි.

(iii) ගිවිසුමේ කොන්දේසිවලට පටහැනිව, කළමනාකරණ ගාස්තු සියයට 15 කින් වැඩි කිරීම, පර්ත් වතුයාය විසින් ආදායම ඒකපාර්ශවිකව උපයෝජනය කිරීම, පර්ත් වතුයායෙන් උපයා ගන්නා ලද රු.මිලියන 20 ක ආදායම කොන්ත්‍රාත්කරු නමින් ආයෝජනය කිරීම, මෝටර් වාහන හා බංගලා කුලී රු.මිලියන 12.42 ක් ජංගම ගිණුම් හරහා කොන්ත්‍රාත්කරුට අවිධිමත්ව මාරු කරගැනීම ආදී පර්ත් වතුයායට අදාළ කරුණු තවමත් විසඳා ගත යුතුව ඇත.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**4.3.1 අපනයන සැකසුම් කලාප (EPZ), කාර්මික උද්‍යාන (IP) සහ ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාත්මක කිරීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අපනයන සැකසුම් කලාප 2 ක්, ප්‍රාදේශීය කාර්යාලයක් හා ප්‍රධාන කාර්යාලය පාඩු පිට පවත්වා ගෙන යන අතර, සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 03 කදී දරන ලද පාඩු පහත දැක්වේ.

| **කලාපය** | **වර්ෂය සඳහා පාඩු** | | | |
|---|---|---|---|---|
| | **2015** | **2014** | **2013** | **2012** |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | (3,323) | 777 | (2,969) | (7,767) |
| කොග්ගල අපනයන සැකසුම් කලාපය | (47,108) | (40,781) | (14,050) | (11,775) |
| මල්වත්ත කාර්මික උද්‍යානය | (1,914) | (4,376) | (2,748) | (5,531) |
| ප්‍රධාන කාර්යාලය | (237,584) | (502,134) | (401,606) | (187,083) |
| වයඹ ප්‍රාදේශීය කාර්යාලය | (30,307) | (28,010) | (9,147) | (21,639) |

(ii) වතුපිටිවල අපනයන සැකසුම් කලාපය හා කාර්මික උද්‍යානයක් හැර පහත සඳහන් අපනයන සැකසුම් කලාප ලාභ මත පවත්වා ගෙන ගොස් තිබුණද, ඒවායේ බදු පූර්ව අතිරික්තය පෙර වර්ෂයට සාපේක්ෂව පහත වැටී තිබුණි. විස්තර පහත දැක්වේ.

| අපනයන සැකසුම් කලාපය | වර්ෂය සඳහා අතිරික්තය | | පහළ යාමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | 2015 | 2014 | |
| | රු.000 | රු.000 | |
| කටුනායක අපනයන සැකසුම් කලාපය | 238,914 | 259,088 | 8 |
| බියගම අපනයන සැකසුම් කලාපය | 127,787 | 159,421 | 20 |
| සීතාවක අපනයන සැකසුම් කලාපය | 163,866 | 217,000 | 24 |
| මීරිගම අපනයන සැකසුම් කලාපය | 29,259 | 39,290 | 26 |
| වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | (3,323) | 777 | 528 |
| හොරණ අපනයන සැකසුම් කලාපය | 66,894 | 77,773 | 14 |
| මාවතගම අපනයන සැකසුම් කලාපය | 4,583 | 14,867 | 69 |
| පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය | 19,879 | 38,534 | 48 |
| මහනුවර කාර්මික උද්‍යානය | 54,025 | 56,545 | 4 |

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ප්‍රවර්ධන අංශය යටතේ දරන ලද රු.2,865,000 ක වියදම් ආයෝජන ප්‍රවර්ධන කාර්යය සඳහා අදාළ වී නොතිබුණි.

## 4.5 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.97,937,000 ක පිරිවැයකට 2004 ජනවාරි 23 දින මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද අක්කර 122 රූඩ් 01 පර්චස් 27.4 ක ප්‍රමාණයකින් යුත් මලිදූව කන්ද වතුයාය නමැති ඉඩම 2016 අප්‍රේල් අවසානය දක්වා කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව 2015 දෙසැම්බර් 31 දිනට මෙම ඉඩමේ පොත් අගය රු.100,800,000 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නොවෙනස්ව පැවතුණු රු.2,203,505 ක් වූ සුනාමි සහන අරමුදලේ ශේෂය අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෞද්ගලික සමාගමක් විසින් ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ඇඟළුම් හා වෙනත් රෙදිපිළි නිෂ්පාදන ව්‍යාපාරයක් අරඹා ක්‍රියාත්මක කිරීමට සහ අපනයනය කිරීමට ආයෝජන මණ්ඩලය සමඟ 1992 අගෝස්තු 14 දින ගිවිසුමකට එළඹ තිබුණි. 1992 නොවැම්බර් 05 දින මණ්ඩලය විසින් ගිවිසුම අවසන් කර තිබූ අතර එකඟ වූ වන්දිය සමඟ සියලු ගොඩනැගිලි හා එහි පැවති යන්ත්‍රෝපකරණ මණ්ඩලයට පැවරීමට දන්වා තිබුණි. එකඟ වූ පරිදි වන්දිය ගෙවීමට ආයෝජන මණ්ඩලය අපොහොසත් වූ බැවින් එය ශ්‍රී ලංකා ජාතික

බේරුම්කරණ මණ්ඩලයට යොමු කර තිබූ අතර සම්පූර්ණ හා අවසාන විසඳුමකට පැමිණීම ලෙස රු.23,835,535 ක් ගෙවීම සඳහා 2000 අගෝස්තු 07 දින තීන්දුව ලබා දී තිබුණි. එකී මුදල ගෙවීම මත, ව්‍යාපාරය විසින් මණ්ඩලයෙන් රු.37,200,000 ක තවදුරටත් ගෙවීමක් අපේක්ෂාවෙන් බේරුම්කරණ පනතේ 31 වගන්තිය යටතේ බේරුම්කරණ තීන්දුව බලාත්මක කිරීමට එච්සී/ඒආර්බී/1254/02 දරන ඉල්ලුම්පත්‍රයක් කොළඹ මහාධිකරණයේ ගොනු කර තිබුණි. 2012 මැයි 14 දින මහාධිකරණය විසින් දුන් තීන්දුව ප්‍රකාරව රු.102,138,350 ක් ගෙවීමට ආයෝජන මණ්ඩලය වගකීමට යටත් විය. ආයෝජන මණ්ඩලය විසින් මහාධිකරණයේ තීරණයට අනුකූල නොවීම හේතුවෙන් වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් රු.102,138,350 ක මුදල සඳහා ලංකා බැංකුවේ අංක 1431688 දරන ගිණුම භාරයට ගැනීමට 2014 දෙසැම්බර් 22 දින නියෝගයක් නිකුත් කර තිබුණි. කෙසේ වුවද 2015 ජනවාරි 01 දින මහාධිකරණ බැංකු ගිණුමකට ආයෝජන මණ්ඩලය විසින් රු.102,138,350 තැන්පත් කර තිබුණි. තවද, මෙම නඩුව අවසන් නොවී පැවතුණද සමාලෝචිත වර්ෂය තුළදී එම මුදල මණ්ඩලය විසින් ලියා හැර තිබුණි.

(ii) රාජ්‍ය වැව්ලි සංස්ථාවේ සභාපති විසින් ආයෝජන මණ්ඩලයට අයත් පර්ත් වතුයායේ සේවකයන් 5 දෙනෙකුගේ වැඩ තහනම් කර තිබුණි. වැඩ තහනම් කරන ලද සේවකයන් විසින් වන්දි ඉල්ලා කම්කරු උසාවියේ නඩුවක් ගොනුකර තිබුණි. කම්කරු උසාවිය විසින් දෙන ලද තීන්දුවට අනුව, වන්දි ලෙස රු.3,820,450 ක මුදලක් සේවකයන්ට ගෙවීමට සිදු වී තිබූ අතර එම මුදල ආයෝජන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව අතර එක්ව හා වෙන් වෙන්ව බෙදී යා යුතුය. එබැවින්, ආයෝජන මණ්ඩලයට රු.1,910,225 ක මුදලක් වන්දි ලෙස සේවකයන්ට ගෙවීමට සිදු වී තිබුණි.

## 4.7 වෙනත් ආයතනවලට මුදාහරින ලද/ ලබාදෙන ලද සම්පත්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) රේඛීය අමාත්‍යාංශය සඳහා මුදාහරින ලද සේවකයන්

යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්තිවලට පටහැනිව, මණ්ඩලයේ සේවකයන් 4 දෙනෙකු උපායමාර්ග සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ අතර 2015 වර්ෂය සඳහා රු.761,711 ක මුදලක් වැටුප් හා අතිකාල දීමනා ලෙස දරා තිබුණි.

### (ආ) මෝටර් වාහන ගාල් කිරීමේ අවසර පත්‍ර

ලෝක වෙළඳ මධ්‍යස්ථාන පරිශ්‍රයේ මෝටර් වාහන ගාල් කිරීමේ අවසරපත්‍ර 12 ක් උපායමාර්ග සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට ලබා දී තිබූ අතර ඒ සඳහා 2015 වර්ෂයේදී රු.625,000 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද මෙම වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට 2016 අප්‍රේල් අවසානය වන විටත් මණ්ඩලයට නොහැකි වී තිබුණි.

## 4.8 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෝෂ්ඨ මට්ටමේ හා කනිෂ්ඨ මට්ටමේ තනතුරු 98 ක් ඇතුළත් විවිධ වර්ගවල තනතුරු පුරප්පාඩු 114 ක් 2015 දෙසැම්බර් 31 වන විටත් පුරවා නොතිබුණි.

(ආ) මධ්‍යම මට්ටමේ සේවකයින් 76 ක් ඇතුළත්ව සේවකයන් 160 ක් අනුමත සේවක සංඛ්‍යාවට වඩා අතිරික්තව පැවතියද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන අතිරික්ත සේවක සංඛ්‍යාව කපා හැරීමට හෝ වෙනත් තැනකට යොදවා ගැනීමට මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ තථ්‍ය මානව සම්පත් අවශ්‍යතාවය සැලකීමෙන් තොරව කොන්ත්‍රාත් හා අනියම් පදනම මත සේවකයන් බොහෝ ගණනක් මණ්ඩලය විසින් බඳවා ගැනීම හේතුවෙන් කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) 9 ක් හා ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයින් 72 ක් මණ්ඩලයේ තථ්‍ය සේවක සංඛ්‍යාවට වඩා අතිරික්තව පැවතුණි.

(ඈ) 2006 අප්‍රේල් 10 හා 2006 මැයි අංක 28 හා 28 (1) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් අනුමැතියක් ලබාගැනීමෙන් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 33 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර 2015 වර්ෂය සඳහා වැටුප් හා අතිකාල ගෙවීම් ලෙස රු.9,560,108 ක මුදලක් දරා තිබුණි.

(ඉ) අනාගත මානව සම්පත් අවශ්‍යතාවයන් සඳහා අනුක්‍රමික සැලැස්මක් මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.

**4.9 මණ්ඩලය විසින් ආරම්භ කර ඇති හා මණ්ඩලයට එරෙහි අධිකරණ ක්‍රියාමාර්ග**

-----------------------------------------------------------------------------------

මණ්ඩලයේ නීති දෙපාර්තමේන්තුවේ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොවූ නඩු 43 ක් පැවති බව නිරීක්ෂණය විය. ඉන් නඩු 38 ක් රු.11,198,251,793 ක වන්දි ඉල්ලමින් මණ්ඩලයට එරෙහිව බාහිර පුද්ගලයන් විසින් ගොනුකර ඇති අතර නඩු 5 ක් රු.4,503,475 ක වන්දි ඉල්ලමින් බාහිර පුද්ගලයන්ට එරෙහිව මණ්ඩලය විසින් ගොනුකර තිබුණි.

**5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

--------------------------------------

**5.1 සංයුක්ත සැලැස්ම**

---------------------

2014 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම අනුව එහි නිශ්චිත කාල රාමුවක් සමඟ නිශ්චිත ඉලක්ක දක්වා නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට අනුකූල වී නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5)(ඇ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ එකඟතාවය සහිතව මණ්ඩලය එහි අවම අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණනය විසින් මූල්‍ය විගණනය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

## 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශවලට අනුව, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

## 5.5 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

### (අ) පුද්ගලික පඩිනඩි පිළිබඳ පාලනය

වෘත්තීය දීමනා, මාසික ප්‍රවාහන දීමනා හා ප්‍රධාන කාර්යසාධන ගෙවීම් ආදී සේවක දීමනා සඳහා ආයෝජන මණ්ඩලය විසින් විධිමත් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

### (ආ) ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් රැස්කර ගැනීම

ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපාරවලින් ලැබිය යුතු හිඟ ශේෂයන් අයකරගැනීමට මණ්ඩලය විසින් විධිමත් හා ඵලදායී පරිපාටියක් අනුගමනය කර නොතිබුණි.

### (ඇ) ගිණුම්කරණය

ජර්නල් සටහන් සඳහා මණ්ඩලය විසින් බලය පැවරීම් සිදුකර තිබුණද, සමහර අවස්ථාවලදී බලය පැවරීම් සීමා ඉක්මවා තිබූ අතර ජර්නල් සටහන් අනුමත කර නොමැති බව නිරීක්ෂණය විය.